# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1425 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 14/11/2023<br>පැය 2020 |

## මාධ්‍ය නිවේදනය

**පස් කන්දක් නායයාමකින් අතුරුදහන් වූ පුද්ගලයින් සිව් දෙනෙකුගේ මෘත ශරීර හමුවීම - බලංගොඩ පොලිස් වසම.**

2023.11.12 වන දින රාත්‍රී කාලයේ බලංගොඩ පොලිස් වසමේ ගවරංහේන, වැහිංතැන්න ප්‍රදේශයේ පැවති අධික වර්ෂාව හේතුවෙන් පස් කන්දක් නායයාමකට ලක්ව නිවාස 03 කට හානි සිදුව, එක් නිවසක සිටි මව, පියා සහ දියණියන් දෙදෙනෙකු අතුරුදහන්ව ඇති බවට බලංගොඩ පොලිසියට ලද පණිවිඩයකට අනුව විමර්ශන ආරම්භ කර තිබුණි.

ඔවුන් සොයා බලංගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන්, යුධ හමුදාව හා ප්‍රදේශවාසීන් සමඟ එක්ව සිදුකළ මෙහෙයුමකින් පසු 2023.11.14 වන අද දින සවස් කාලයේ අතුරුදහන් වූ එකම පවුලේ මව, පියා සහ දියණියන් දෙදෙනාගේ සිරුරු සොයා ගෙන ඇත.

**මරණකරු හා මරණකාරියන් අවුරුදු 45, 40, 16 සහ 10 යන වයස් වල පසු විය.**

පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීර බලංගොඩ රෝහල් මෘත ශරීරාගාරය වෙත යොමු කිරීමට කටයුතු කර ඇති අතර බලංගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**